# ACCOUNTING
# &
# IT'S NEED
# (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ගිණුම්කරණ පරිසරය:

ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට බලපෑම් ඇති කරන පරිසරය ගිණුම්කරණ පරිසරයයි.

## ව්‍යාපාරයක ගිණුම්කරණ ක්‍රියාවලියට බලපෑම් ඇති කරන ප්‍රධාන පරිසර සාධක

| පරිසර සාධකය | හැඳින්වීම | විචල්‍යයන් |
|---|---|---|
| 01. ආර්ථික හා දේශපාලන පරිසරය | කිසියම් රජයක් තම ආර්ථික ප්‍රතිපත්ති සැලසුම් කර, ක්‍රියාත්මක කිරීමේදී ගන්නා තීරණ ආර්ථික හා දේශපාලන පරිසරය ලෙස හැඳින්වේ. | බදු ප්‍රතිපත්තිය<br>විනිමය අනුපාත<br>මිල මට්ටම්<br>රාජ්‍ය ප්‍රතිපත්ති (පොලී අනුපාත, වැටුප් තීරණ)<br>වෙළෙඳපොල තත්ත්වය (මූල්‍ය/ප්‍රාග්ධන) |

ClassWork.LK

| | | |
|---|---|---|
| 02. ශිල්පීය හා වෘත්තීය පරිසරය | ගිණුම්කරණ ක්‍රියාවලියේ දී ව්‍යාපාර සම්පත් ප්‍රමාණාත්මකව හා මූල්‍යමය වශයෙන් මැනීම හා තක්සේරු කිරීමට යොදා ගන්නා විවිධ ශිල්පීය ක්‍රම ඇතුළත් පරිසරය ශිල්පීය හා වෘත්තීය පරිසරය වේ. | ගිණුම්කරණ ප්‍රමිත<br><br>ගිණුම්කරණ ශිල්ප ක්‍රම<br><br>ගිණුම්කරණ වෘත්තීය ආයතන |
| 03. නෛතික පරිසරය | ව්‍යාපාර විසින් ගිණුම්කරණ ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු නෛතික තත්ත්වයන්, නෛතික පරිසරය ලෙස හැඳින්වේ. | 2007 අංක 07 සමාගම් පනත<br><br>1890 හවුල් ආඥා පනත<br><br>දේශීය ආදායම් පනත<br><br>ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත<br><br>ගිණුම්කරණයට අදාළ නඩු තීන්දු |
| | සමාජයේ සිටින පුද්ගලයින්ගේ සිතුම්, | ආකල්ප |

ClassWork.LK

| | | |
|---|---|---|
| 04. සමාජ හා සංස්කෘතික පරිසරය | පැතුම් හා ආකල්ප සහිත වටපිටාව සමාජ හා සංස්කෘතික පරිසරය ලෙස හැඳින්වේ. | සිරිත්-විරිත්<br><br>පුරුදු<br><br>විශ්වාස<br><br>ජන සංඛ්‍යාව<br><br>ජන සංක්‍රමණය<br><br>පුද්ගල ජීවන රටා |
| 05. තාක්ෂණික පරිසරය | ව්‍යාපාරවල ගිණුම්කරණ කටයුතු පහසු කිරීම සඳහා විවිධ තාක්ෂණික උපකරණ භාවිත කිරීම තාක්ෂණික පරිසරය ලෙස හැඳින්වේ. | පරිගණක තාක්ෂණය<br><br>නව තාක්ෂණික උපකරණ භාවිතය<br><br>සන්නිවේදන තාක්ෂණය |

ClassWork.LK

# ගිණුම්කරණ පරිසරය සාධකවල වෙනස්වීම් ගිණුම්කරණයට බලපාන ආකාරය

| පරිසර සාධකය | පරිසර සාධක විචල්‍යය | ගිණුම්කරණයට බලපාන ආකාරය |
|---|---|---|
| 01. ආර්ථික හා දේශපාලන පරිසරය | පොලී අනුපාතය | පොලී අනුපාතය අඩු කිරීම නිසා බැංකු ණය ලබා ගැනීමට පෙළඹේ.<br><br>අතිරේක ණය ලබා ගැනීම වැඩි වී ව්‍යාපාර වර්ධනයක් ඇති වී ආදායම් වැඩි වේ. |
| 02. ශිල්පීය හා වෘත්තීය පරිසරය | දේපළ පිරියත හා උපකරණ ගිණුම්කරණ ප්‍රමිතිය අනුව ක්ෂය කිරීම | බොහෝ ව්‍යාපාර විවිධ ක්ෂය ක්‍රම අතුරින් සරල මාර්ග ක්ෂය ක්‍රමය භාවිත කිරීම නිසා ගිණුම් තොරතුරුවල ඒකාකාරී බව ආරක්ෂා වීම තුළින් ගුණාත්මක බව වැඩි වීම. |
| | 1890 හවුල් ආඥා | ලිඛිත ගිවිසුමක් |

ClassWork.LK

| | | |
|---|---|---|
| **03.** නෛතික පරිසරය | පනත<br><br>**2007** අංක **07** සමාගම් පනත | නොමැති ව පවත්වා ගෙන ගිය හවුල් ව්‍යාපාරයක ලාභය සම සමව බෙදා ගත යුතුයි.<br><br>සෑම සීමිත පොදු සමාගමක් ම සමාගම් පනතට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| **04.** සමාජ හා සංස්කෘතික පරිසරය | පුද්ගල ජීවන රටා | දේශීය ආහාර ගැනීමේ රටාවට ජනතාව වැඩි නැඹුරුවක් දැක්වීම නිසා, දේශීය ආහාර වර්ග නිපදවීමේ ව්‍යාපාර වැඩි වශයෙන් ආරම්භ වීම හා එම ව්‍යාපාරවල අලෙවිය වැඩිවීම හා ලාභය වැඩිවීම. |
| **05.** තාක්පණික පරිසරය | නව තාක්පණික උපකරණ ගිණුම්කරණ කටයුතු වලට භාවිත කිරීම. | රත්‍රන් අලෙවි කිරීමේදී "ඩෙන්සි මීටරය" භාවිත කිරීම නිසා ව්‍යාපාරවල සිදුවිය හැකි වංචා අවම වී ආදායම් ඉහළ යාම. |

ClassWork.LK

**අභ්‍යාස**

(01) පහත සඳහන් පරිසර සාධක විචල්‍යයන් නිවැරදි පරිසර සාධකයට ඇතුලත් කරන්න.

**<u>පරිසර සාධක විචල්‍යයන්</u>**

1) විනිමය අනුපාත

2) මිල මට්ටම

3) ගිණුම්කරණ ප්‍රමිත

4) සන්නිවේදන තාක්ෂණය

5) නව තාක්ෂණික උපකරණ

6) හවුල් ආඥා පනත

7) බදු ප්‍රතිපත්තිය

8) ජන සංක්‍රමණය

9) පරිගණක තාක්ෂණය

10) ගිණුම්කරණ වෘත්තීය ආයතන

11) සමාගම් පනත

12) පුද්ගල ජීවන රටා

ClassWork.LK




ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය

ආර්ථික විද්‍යාව

ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura